පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2024.12.19 පැය 1545 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 1867 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

## 01. මෘත ශරීරයක් හමුවීම - පස්සර පොලිස් වසම.

2024.12.19 වන දින උදෑසන කාලයේ පස්සර පොලිස් වසමේ පස්සර බදුල්ල මාර්ගයේ 10 කණුව ආසන්නයේ මාළු වෙළඳසැලක් අසල පුද්ගලයකු මිය ගොස් ඇති බවට ලද තොරතුරක් මත පස්සර පොලිසිය විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත. සිදු කරන ලද වැඩිදුර විමර්ශණයේදී මිය ගිය පුද්ගලයා පස්සර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු බවට අනාරණය වී ඇති අතර මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත ශරීරය සම්බන්ධයෙන් පස්සර ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති අතර මෘත ශරීරය බදුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අපරාධ වලට අවශ්‍ය කර සිටි සැකකරුවකු අත්අඩංගුවට - පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.18 වන දින උදෑසන කාලයේ කඳාන පොලිස් වසමේ රත්ගම ප්‍රදේශයේදී පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර 2024.12.13 වන දින කඳාන පොලිස් වසමේ නිවසකට වෙඩි තබා අනර්ථය කිරීමේ සිද්ධියට යොදා ගත් යතුරුපැදිය රත්ගම සිට මොරටුව රාවතා වත්ත ප්‍රදේශය දක්වා ගෙන ගොස් අපරාධය සඳහා ආධාර අනුබල ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍ය කර සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 21 වන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**